ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 නොවැම්බර් 25 |

## බැංකු අධ්‍යක්ෂවරුන්ගේ සම්මන්ත්‍රණය 2014

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂිකව පවත්වන බැංකු අධ්‍යක්ෂවරුන්ගේ සම්මන්ත්‍රණය ‘‘2020 ඉදිරි දැක්ම: මූර්ත ආර්ථිකය උදෙසා බැංකු අංශය සමගාමීකරණය’’ යන තේමාව යටතේ 2014 නොවැම්බර් 26 දින පැවැත්වීමට නියමිතය.

ඇමෙරිකානු ඩොලර් බිලියන 150 ක ආර්ථිකයක් සහ ඇමෙරිකානු ඩොලර් 7000 ඉක්මවූ ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිතයක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණ පෙරදැරිව, ඒ තුළින් මූර්ත ආර්ථිකය තුළ ඇති විය හැකි අවශ්‍යතා සහ වෙනස්කම් අනුව සමගාමීවීමේදී බැංකු අංශයෙහි කාර්යභාරය සාකච්ඡා කිරීම වැදගත් වේ යැයි ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. ඒ අනුව, ශ්‍රී ලංකාව 2020 ඉදිරි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා යන ගමනෙහිදී බැංකු මගින් සිදුකරනු ලබන උපායමාර්ගික කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කර ගැනීම පිණිස, විශේෂයෙන්ම පරිවර්තනීය වෙනසක් සඳහා නායකත්වය දීම උදෙසා මෙම වසරේ සම්මන්ත්‍රණය මනා පිටුවහලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

බලපත්‍රලාභී බැංකු 34 ක අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් 200 කට වැඩි සංඛ්‍යාවක් මේ වසරේ සම්මන්ත්‍රණය සඳහා සහභාගි වනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමන් විසින් මෙම සම්මන්ත්‍රණයෙහි ප්‍රධාන දේශනය පවත්වනු ලැබේ. මෙම සම්මන්ත්‍රණයේදී, බැංකු අධ්‍යක්ෂවරුන්ගේ උපායමාර්ගික නායකත්වය පිළිබඳ විශේෂයෙන් අවධාරණය කරමින් ගෝලීය පරිසරයෙහි ඉස්මතු වන නව ප්‍රවණතා, බැංකු සඳහා ණය ශ්‍රේණිගතකරණයෙහි වැදගත්කම, ඩිජිටල් යුගයෙහි බැංකුකරණය මුල්කර ගෙන පරිවර්තනීය වෙනසක් සහ බලගැන්වීම සඳහා උපායමාර්ගික සැලසුම්කරණය සහ වෙන් වෙන් වශයෙන් අවදානම් කළමනාකරණය කිරීමෙන් බැහැරවීමෙහි වැදගත්කම යන මාතෘකා පුළුල් ලෙස

සාකච්ඡාවට බඳුන් වනු ඇත. දේශීය සහ විදේශීය ආයතන නියෝජනය කරමින් විද්වත් සම්පත් දායකයන්, මැලේසියාවේ අයික්ලිෆ් නායකත්ව සහ යහපාලන කේන්ද්‍රයෙහි ප්‍රධාන විධායක නිලධාරී සහ විධායක අධ්‍යක්ෂ රජීව් පේෂවරියා මහතා, ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ රාජ්‍ය අංශය සහ සංවර්ධන සංවිධාන හි කළමනාකාර අධ්‍යක්ෂ කැතරීන් බූවියර් ඩිවෝ මහත්මිය, ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී හි විධායක උප සභාපති සහ සමූහ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී රමේෂ් ෂන්මුගනාදන් මහතා සහ රිස්ක්බිස්නස් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් හි ප්‍රධාන විධායක නිලධාරී මයික් ෆින්ලේ මහතා, මෙහිදී දේශන පවත්වනු ඇත.

මෙම සම්මන්ත්‍රණයේදී, 2020 ඉදිරි දැක්ම ළඟාකර ගැනීමේදී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නව අවස්ථා සොයා ගැනීමට බැංකු අංශය සඳහා ඇති සුවිශේෂී කාර්යභාරය සම්බන්ධයෙන් අදහස් සහ අත්දැකීම් හුවමාරු කර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.